SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 2

### යේසුස්වහන්සේ–උතුම්වූ ගුරුතුමා

- සූදානම් වීමේ කාලය
- දෙවියන්වහන්සේගේ වැඩට ආලේපය ලැබීම
- යේසුස්වහන්සේ ගැමි ලඳකට උගන්වයි
- යේසුස්වහන්සේ ධනවතෙකුට උගන්වයි

# සූදනම් වීමේ කාලය.

## යේසුතුමා මිනිස් අවශ්‍යතාවයන් තේරුම් ගනී

ගලීල පළාතේ 15,000 ක පමණ ජනගහණයක්වූ නාසරෙත් නුවර යේසුස්වහන්සේ වැඩුණු සේක. එය යෙරුසලමටත් තීර් හා සීදොන් යන නැව් තොට දෙකටත් අතර මහ මාර්ගයේ පිහිටි නැවතුම් පොලකි. දුෂ්ශීලය හා අපරාධය කෙතරම් සාමාන්‍යව තිබුණේද කිවහොත් ''නාස රෙත් නුවරින් යම් යහපතක් එන්ට පුළුවන්ද''යි මනුෂ්‍යයෝ කීවෝය. යේසුස්වහන්සේ පාපිෂ්ඨකම දුටුසේක. එනම් ආත්මාර්ථකාමීත්වය, දූෂණය, කෲරකම සහ දෙවියන්වහන් සේට විරුද්ධව කැරලි ගැසීම යන මේවාය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම පාපයේ වහලුන්ව සිටි බව උන්වහන්සේ දුටු සේක.

යේසුස් වහන්සේ යෝසෙප් සමඟ වඩු මඩුවේ වැඩ කරමින් සිටියදී රෝම ආධිපත්‍යයෙන් මිදෙන්ට මිනිසුන්ගේ ප්‍රාර්ථනය උන්වහන්සේට ඇසුණි. නමුත් මෙම දේශපාලන නිදහසින් පමණක් ඔවුන්ගේ ප්‍රශ්ණ නොවිසඳෙන බව උන් වහන්සේ දන සිටි සේක. එම මිනිසුන්ට අවශ්‍යව තිබුණේ ඔවුන්ගේ ජීවිත පාලනය කළ පාපයෙන් නිදහස් වීමටයි. උන්වහන්සේ මෙලොවට පැමිණ සිටියේ මෙම නිදහස ගෙන දීමටය. උන්වහන්සේගේ යේසුස් යන නමෙහි අර්ථය ගැළවුම්කාරයා යන්නය. දේවදූතයා යෝසෙප්ට මෙසේ කියන ලදී.

> ''උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න මක්නිසාද තමුන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගල වන්නේ උන්වහන්සේය.'' මතෙව් 1:21

## යේසුස් වහන්සේ දේව වචනය හදරයි.

යේසුස් වහන්සේ දේව වචනය හදාරා උන්වහන්සේගේ ජීවිතයේ කාර්ය භාරය සඳහා සූදනම් වූ සේක. වයස දොළහේදී උන්වහන්සේගේ ගුරුවරුනට වඩා හොඳින් දේව වචනය වටහා ගත්සේක. උන්වහන්සේ එයට ප්‍රේම කර නිතර එයට කීකරු වූසේක.

## යේසුස් වහන්සේ බව්තිස්මය ලබයි



යේසුස් වහන්සේ තිස්වන වියේදී නාසරෙත් නුවර හැරදමා දේව වචනය උගන්වමින් නගරයක් නගරයක් පාසා ගිය සේක. යොහන් බව්තීස්ත දේශනා කරමින් සිටි තැනට දෙවියන් වහන්සේ උන්වහන්සේව යැව් සේක. යොහන් උන්වහන්සේව යොර්දාන් ගඟෙහි බව්තිස්ම කළේය.

© ඉංග්‍රීසි – 1970 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය
© සිංහල – 1982 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

යේසුස් වහන්සේ බව්තිස්මය ලැබූ විගසම දියෙන් ගොඩනැඟුනු සේක. එවිට අහස උන්වහන්සේට විවර විය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන් සේ දුටුසේක. තවද: ''මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ප්‍රසන්නව සිටිමි'යි අහසින් හඬක් විය. මතෙව් 3: 16, 17

### ඔබේ අභ්‍යාසය සඳහා

1. හිස්තැන් පුරවන්න.

''යේසුස් යන්නෙහි අර්ථය නම්.................

යේසුස් වහන්සේව...........ගඟෙහි...........

බව්තිස්ත විසින් බව්තිස්ම කරන ලදී.

''මොහු මාගේ ප්‍රේමවන්ත.........''යයි දෙවියන්වහන්සේ කී සේක.

2. යේසුස්වහන්සේ උන්වහන්සේගේ සෙනඟව කුමකින් ගළවන සේක්ද?

... (අ) රෝම ආණ්ඩුවෙන්

... (ආ) දිළිඳුකමින් හා රෝගවලින්

... (ඇ) ඔවුන්ගේ පාපවලින්

# දෙවියන්වහන්සේගේ වැඩට ආලේපය ලැබීම.

දෙවියන්වහන්සේ උදෙසා වැඩකිරීමට ශුද්ධාත්ම යාණන්වහන්සේ උපකාර කරන බව පෙන්වීමට අනාගත වක්තෘවරුන්, පූජකයන් හා රජවරුන් තෙල්වලින් ආලේපය ලැබුවෝය. පොරොන්දුවූ ගැළවුම්කාරයාණන්ට මෙසියස්වහන්සේ හෙවත් ක්‍රිස්තුස්වහන්සේ යයි අමතන ලදී. මෙම නම් දෙකෙහිම අර්ථය ''ආලේපලත්'' යන්නයි. යෙසායා අනාගතවක්තෘ උන්වහන්සේ ගැන මෙසේ ලියන ලදී.

ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන් වහන්සේ මා ආලේප කළසේක. වහලුන්ට මිදීම සහ අන්ධයින්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනා ලද්දවුන් නිදහස්කර හරින්ටද ස්වාමීන්වහන්සේගේ පිළිගතයුතු අවුරුද්ද ප්‍රකාශකරන්ටද උන්වහන්සේ මා එව් සේක. ලූක් 4:18, 19

යෙසායාගේ අනාවැකිය යේසුස්වහන්සේ තුලින් සැබෑ විය. උන්වහන්සේ ශුභාරංචිය දේශනා කරමින් සැමතැන කම ගිය සේක. රෝගී මනුෂ්‍යයන්ට අත තබා සුවකළ සේක. අන්ධයන්ට නැවත දකින්ට හැකිවිය. පාපයේ වහල්ව සිටි අය නිදහස ලදහ. යෙසායාගේ අනාගත කීම ගැන යේසුස්වහන්සේ මෙසේ කීසේක. ''මේ ශුද්ධ ලියවිලි කොටස අද සැබෑවිය.''

**ඔබේ අභ්‍යාසය සඳහා**

3. යෙසායාගේ අනාවැකිය කටපාඩම් කරන්න.
4. ''ආලේපලත්'' යන අරුත ගෙනෙන්නේ කුමන නාමයකින්ද?

 ......................................................

5. යේසුස්වහන්සේට ලෙඩුන් සුව කිරීමට හැකි වූයේ මන්ද?
 ... (අ) උන්වහන්සේ බොහෝ ප්‍රතිකාර දැනසිටි නිසා.
 ... (ආ) උන්වහන්සේ වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනගෙන සිටි නිසා.
 ... (ඇ) එය කිරීමට ස්වාමීන්ගේ ආත්මයාණන් උන්වහන්සේව ආලේප කළ නිසා.

# යේසුස්වහන්සේ ගැමි ලඳකට උගන්වයි.

## සමාරිය මැදින් ගමනක්



යේසුස්වහන්සේ තම සහකරුවන් වීමට මිනිසුන් දොළොස්දෙනෙකු තෝරාගත් සේක. අපි ඔවුන්ව උන් වහන්සේගේ ගෝලයන් හෙවත් ශිෂ්‍යයන් යනුවෙන් හඳුන්වමු. ඔවුන්ගෙන් දෙදෙනෙකු වන මතෙව් සහ යොහන් යේසුස්වහන්සේගේ ජීවිතය ගැන ලිවූහ. සමාරියට ගිය ගමන ගැන යොහන් කියයි.

ගලීලයේ සිට යෙරුසලමට කෙටිම මාර්ගය තිබුණේ සමාරිය මැදිනි. බොහෝ දෙන සමාරිතයන්ව පිළිකුල් කළ බැවින් දුර මාර්ගය පාවිච්චි කළහ. ඔවුන් සමාරිතයන්ව හෙළා දුටුවේ ඔවුන් වෙනත් ජාතියකට අයත්ව වෙනස් චාරිත්‍ර ඇතිව සිටි නිසාය. නමුත් යේසුස්වහන්සේ සමාරිතයන්ව ඒ අන්දමින් නොසැලකූසේක. උන්වහන්සේ සියල්ලන්ටම ප්‍රේමකළසේක. දෙවියන්වහන්සේ සියළුම ජාතීන්ට ගැළවීමේ ආලෝකය එවීමට පොරොන්දුවූසේක. යේසුස්වහන්සේ සමාරිය මැදින් ගියේ දෙවියන්වහන්සේගේ ගැලවීම එතැනටද ගෙන යන පිණිසය.

## ඔබේ අභ්‍යාසය සඳහා

6. යේසුස්වහන්සේ සමාරිතයන්ට මිත්‍රකම පෙන්වූ සේක්ද?

... (අ) නැත. ඔවුහු වෙනත් ජාතියකට හා ආගමකට අයත්ව සිටියහ.

... (ආ) එසේය. යේසුස්වහන්සේ සියල් ලන්ටම ප්‍රේම කළ සේක.

... (ඇ) නැත. ඔවුහු ඉතාමත්ම පාපිෂ්ඨව සිටියහ.

## තෘප්තිය ගෙන දෙන දිය

සිඛාර් නම් ගමේදී ගෝලයන් ආහාර මිළදී ගෙන ඒමට ගිය අතර යේසුස්වහන්සේ ළිඳක් අසල වාඩිවූ සේක. සමාරිත ස්ත්‍රියක් වතුර ගැනීමට පැමිණිවිට උන්වහන්සේ බොන්න දෙන්නැයි ඇගෙන් ඉල්ලූ සේක. යේසුස්වහන්සේ ඇයට කතා කිරීම ගැන ඇය පුදුමයට පත්වූවාය.

> යේසුස්වහන්සේ ඇයට උත්තර දෙමින්: ''දෙවියන් වහන්සේගේ දීමනාවත් මට බොන්ට දියන්නැයි නුඹට කීවේ කව්ද කියාත් නුඹ දැනගෙන සිටියා නම් නුඹ ඔහු ගෙන් ඉල්ලනවා ඇත. එවිට ඔහු නුඹට ජීවනදායක වතුර දෙනවා ඇතැයි'' කීසේක. ස්ත්‍රීද!, ''ස්වාමීනි වතුර අදින්ට භාජනයක් ඔබට නැත. ළිඳත් ගැඹුරුය. එබැවින් ජීවනදායක වතුර ඔබට කොයින්ද?'' යි කීවාය. යේසුස්වහන්සේ උත්තර දෙමින්: ''මේ වතුර බොන හැම දෙනාම නැවත පිපාස වන්නේය. නමුත් මා දෙන වතුරෙන් බොන කවරෙකුට නමුත් කිසි කලෙක පිපාස නොවන්නේය. මා ඔහුට දෙන වතුර ඔහු තුලෙහි සදාකාල ජීවනය නික්මවෙන්නාවූ වතුර උල්පතක් වන්නේය'' කීසේක. යොහන් 4: 10-14

අපේ ශරීරයට ජලය අවශ්‍යවූ විට අපට පිපාස ඇතිවේ. අපේ ශරීරයට ජලය අවශ්‍ය වන්නාක් මෙන් අපේ ආත්මයටද යමක් අවශ්‍ය වෙයි. මෙය සොයා ගන්නා තෙක් අපි සැහීමක් නොමැතිවද, ආත්මික පිපාසයෙන්ද සිටින්නෙමු.

සමාරිත ස්ත්‍රිය ආලය තුලින් තෘප්තිය ලබාගැනීමට උත්සාහ දරුවාය. ඇය පස්වරක් විවාහ වී සිටිය නමුත් ඇගේ ස්වාමිපුරුෂයා නොවන මනුෂ්‍යයෙකු සමඟ එක්ව ජීවත් වෙමින් සිටියාය. යේසුස්වහන්සේ ඇයව දුටු විගසම ඇය පිළිබඳ සියල්ලම දැන ගත් සේක. ඇගේ පාපවලට කමාව ලැබෙන තුරු ඇ ප්‍රීතියට පත් නොවන බව උන් වහන්සේ දැනගත් සේක. ඒ නිසා උන්වහන්සේ ඇගේ පව් ගැන ඇයට පැවසූ සේක. එය යේසුස්වහන්සේ වදළ ලෙසම වූ බව ඇය පිළිගත්තාය.

සමාරිත ස්ත්‍රිය යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු වන අනාගතවක්තෘ කෙනෙකු බව වටහා ගත්තාය. තමාට උදව් කිරීමට උන්වහන්සේට පුළුවන් බව ඇය ඒකාන්තයෙන්ම දැන සිටියාය. දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේ කෙසේදැයි ඇය විචාළාය. යේසුස්වහන්සේගේ පිළිතුර කටපාඩම් කරන්න.

> ''දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමින්ද නමස්කාර කළ යුතුය.'' යොහන් 4:24

යේසුස්වහන්සේද තමා මෙසියස්වහන්සේ බව ඇයට දැන්වූසේක. ගැළවුම්කාරයාණන් හමුවීම සමාරිත ස්ත්‍රියට කෙතරම් ප්‍රීතියක්ද? එතැන් පටන් ඇගේ ජීවිතය වෙනස් විය. ඇගේ හිතවතුන්ට යේසුස්වහන්සේ ගැන කියන පිණිස ඇය දුව ගියාය. ඔවුන්ටද මෙම ජීවනදායක වතුර අවශ්‍යව තිබුණි.

> තවත් බොහෝ දෙනෙක් උන්වහන්සේගේ වචන නිසා අදහා ස්ත්‍රියට කථාකොට ''අප දැන් අදහන්නේ තුඹේ කීම නිසා නොවේ. මක්නිසාද අපිම අසා සැබෑවටම මුන්වහන්සේ ලෝකයේ ගැළවුම්කාරයා-ණන් බව දනිමු''යයි කීවෝය. යොහන් 4 : 41-42

මනුෂ්‍යයෝ නොයෙක් දේ තුලින් එනම් ප්‍රේමයෙන්, කාමයෙන්, මත් ද්‍රව්‍ය, බීමත්කම, අධ්‍යාපනය බලය, ආගම්; යහපත් ක්‍රියා හෝ ලෞකික ආශාවලින් ඈත්වීම ආදියෙන් ප්‍රීතිය සෙවීමට උත්සාහ කරති. මේ එකකින්වත් තෘප්තිය ගෙන නොදේ. ඔබේ පිපාසය සංසිඳවිය හැක්කේ යේසුස් වහන්සේට සහ උන්වහන්සේගේ ගැළවීමට පමණි.

### යාච්ඤාව

මාව සැදූ දෙවියන්වහන්ස, මාගේ පිපාසිත ආත්මයට අවශ්‍ය කුමක්දැයි ඔබ දන්නා සේක. කරුණාකර මගේ පාප වලට කමාවුව මැනව. මගේ පිපාසය සංසිඳුවා ගැනීමට මට ජීවනදායක පැන් දුන මැනව. ආත්මයෙන් හා සැබෑකමින් ඔබවහන්සේට නමස්කාර කිරීමට ඉගැන්නුව මැනව. යේසුස්වහන්සේව මුණ ගැසී උන්වහන්සේ ලෝකයේ ගැළවුම්කාරයාණන් බව දැනගන්ට සැලැස්වුව මැනව.

### ඔබේ අභ්‍යාසය සඳහා

7. යේසුස්වහන්සේ තුලින් නියම තෘප්තිය ඔබ සොයාගෙන තිබේද?

.................................................

එය ලබාගැනීමට ඔබ කැමැත්තේද?...........
ඉහත සඳහන් යාච්ඤාව පස්වරක් කියවන්න.

# යේසුස්වහන්සේ ධනවතෙකුට උගන්වයි

එක් ධනවත් මනුෂ්‍යයෙක් යේසුස්වහන්සේ වෙතට දුවැවිත් උන්වහන්සේ ඉදිරියේ දණින් හිඳ ''යහපත් ආචාරීන් වහන්ස සදාකාල ජීවනය ලබාගන්නා පිණිස මා විසින් කුමක් කළ යුතුද''යි ඇසීය. ධනවතා ස්වර්ගයේ ඇති අලංකාර නිවසට ඇතුළුවීමට ප්‍රමාණවත් තරම් යහපත් වීමට වෙර දැරීය. ඔහු මිනීමැරීම හෝ කාමමිථ්‍යාචාරය කර නොතිබුණි. ඔහු සොරකම් කිරීම බොරු කීම හෝ වංචා කර නොතිබුණි. සිය මාපියන්ටද ගරු කළේය.



ඔහු එතරම් හොඳ කෙනෙකු වුවත් යමක් අඩුව සිටියේය. ස්වර්ගයට යාමට තරම් කිසිවෙක් යහපත් නොවේ. ඔහුගේ පාපය වූයේ තමකමයි. අන්‍යයන්ට උපකාර කරනවාට වඩා ඔහු තම සැප පහසුව ගැන සිතීය. ඔහු දෙවියන් වහන්සේට වඩා මුදලට ප්‍රේම කළේය. සමාරිත ස්ත්‍රියට මෙන්ම ඔහුටද ගැලවීම අවශ්‍ය විය. සැබෑ ප්‍රීතිය හා සදාකාල ජීවනය ලබාගැනීමට නම් අපි දෙවියන් වහන්සේට ප්‍රථම ස්ථානය දිය යුතුය.

> යේසුස්වහන්සේ ඔහු දෙස බලා ඔහුට ප්‍රේමකොට, ''නුඹට එකක් අඩුය. ගොස් නුඹ සන්තක සියල්ල විකුණා දිළිඳුන්ට දීපන්න. ස්වර්ගයෙහි නුඹට වස්තු ඇතිවන්නේය. නුඹ මා අනුව වරෙන්න''යි ඔහුට කීසේක. මාර්ක් 10:21

ඔහු සොයමින් සිටි දෙය, එනම් සදාකාල ජීවනය ඔහුට දීමට යේසුස්වහන්සේට හැකිවූ නමුත් අසරණ මනුෂ්‍යයා එය නොලබා ශෝකයෙන් ඉවතට ගියේය. ඔහු ස්වර්ගීය ධනයට වඩා මෙලොව ධනයට කැමතිව එය තෝරා ගත්තේය.

**ඔබේ අභ්‍යාසය සඳහා**

8. ධනවතා ගත් තීරණය හරියයි ඔබ සිතනවාද?

   ...........................................................

9. යහපත් වීමට වෙර දැරීමෙන් ඔබට ස්වර්ගයට ඇතුළුවන්නට හැකිද? ..............................

## ශුභ පැතුම්

දැන් ඔබ මෙම පාඩම් මාලාවේ තුනෙන් පංගුවක් අවසන් කර ඇත. පහත සඳහන් ලිපිනයට මෙම පොත් පිංච තැපැල් කර එවන්න. අපි එය ශ්‍රේණිගතකර තුන්වන පාඩම සමග ආපසු එවන්නෙමු.

## අදහස් හා යාච්ඤා ඉල්ලීම්

ඔබට ආත්මික උවමනාවක් හෝ කරදරයක් තිබේ නම් ඔබේ ගුරුවරයා ඔබ ගැන යාච්ඤා කිරීමට කැමැත්තෙන් සිටී.

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

ඔබේ නම:....................................................................

ලිපිනය:......................................................................

දිස්ත්‍රික්කය: ..............................................................

වයස:............... ස්ත්‍රී පුරුෂ භාවය: ..............

**අපේ ලිපිනය**

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

**තැ. පෙ. [redacted]**

**[redacted]**

සිමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8 හැව්ලොක් පාර කොළඹ 6.